# ශ්‍රී ලංකා
# ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ
# පාර්ලිමේන්තුව

---

# 1988 අංක 26 දරන
# විශ්ව විද්‍යාල (සංශෝධන) පනත

---

[සහතිකය සටහන් කළේ 1988 ජූලි මස 21 වන දින]

**ආණ්ඩුවේ නියමය පරිදි මුද්‍රණය කරන ලදී.**

---

1988 ජූලි මස 22 වැනි දින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ II වන කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී

කොළඹ රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිල දී ලබාගත හැකිය

මිල : ශත 60 යි.

තැපැල් ගාස්තුව : ශත 75 යි

# 1988 අංක 26 දරන විශ්ව විද්‍යාල (සංශෝධන) පනත

[සහතිකය සටහන් කළේ 1988 ජූලි මස 21 වන දින]

එල්.ඩී.—ඕ. 13/88.

## 1978 අංක 16 දරන විශ්ව විද්‍යාල පනත සංශෝධනය කිරීම සඳහා වූ පනතකි.

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ:—

1. මේ පනත, 1988 අංක 26 දරන විශ්ව විද්‍යාල (සංශෝධන) පනත යනුවෙන් හඳුන්වනු ලබන අතර, ගැසට් පත්‍රයෙහි පළ කරනු ලබන නියමයකින්, අමාත්‍යවරයා විසින් නියම කරනු ලබන දිනයක සිට එය ක්‍රියාත්මක වන්නේ ය. *(ලුහුඬු නාමය සහ ක්‍රියාත්මක වන දිනය.)*

2. (මෙහි මින් මතු "ප්‍රධාන ප්‍රඥප්තිය" යනුවෙන් සඳහන් කරනු ලබන) 1985 අංක 7 දරන පනතින් සංශෝධිත, 1978 අංක 16 දරන විශ්ව විද්‍යාල පනතේ XIV වන කොටසෙහි අඩංගු "ශිෂ්‍ය සම්බන්ධතා සභා සහ වෙනත් සංගම්" යන ශීර්ෂ පාඨය වෙනුවට පහත දැක්වෙන ශීර්ෂ පාඨය මෙයින් ආදේශ කරනු ලැබේ:— *(1978 අංක 16 දරන පනතේ XIV වන කොටසෙහි ශීර්ෂ පාඨය සංශෝධනය කිරීම.)*

"විශ්ව විද්‍යාල ශිෂ්‍ය සමිතිය සහ වෙනත් සංගම්".

3. ප්‍රධාන ප්‍රඥප්තියේ 112 වන වගන්තිය මෙයින් ඉවත් කර, ඒ වෙනුවට පහත දැක්වෙන වගන්තිය ආදේශ කරනු ලැබේ:— *(ප්‍රධාන ප්‍රඥප්තියේ 112 වන වගන්තිය ප්‍රතියෝජනය කිරීම.)*

*("විශ්ව විද්‍යාල ශිෂ්‍ය සමිතිය, පීඨ ශිෂ්‍ය සමිතිය යනාදිය.)*

112. (1) එක් එක් උසස් අධ්‍යාපන ආයතනය සඳහා විශ්ව විද්‍යාල ශිෂ්‍ය සමිතියක් තිබිය යුතු අතර එහි සංයුතිය, කාර්ය සහ කර්තව්‍ය මේ පනතේ උපලේඛනයෙහි නියම කර ඇති පරිදි විය යුතු ය.

(2) උසස් අධ්‍යාපන ආයතනයක එක් එක් පීඨය සඳහා පීඨ ශිෂ්‍ය සමිතියක් තිබිය යුතු අතර, එහි සංයුතිය, කාර්ය සහ කර්තව්‍ය මේ පනතේ උපලේඛනය මගින් නියම කරනු ලැබිය යුතු ය.

(3) (1) වන සහ (2) වන උපවගන්තිවල සඳහන් සමිතිවල නිලධරයන් තෝරා පත් කර ගැනීම සඳහා ඡන්ද විමසීම් පවත්වන ආකාරය ද, ඒ නිලධරයන්ගේ කාර්යයන් සහ කර්තව්‍යයන් ද, එක් එක් උසස් අධ්‍යාපන ආයතනයේ පාලක මණ්ඩලය විසින්, අතුරු ව්‍යවස්ථා මගින්, නියම කළ යුතු ය.".

4. ප්‍රධාන ප්‍රඥප්තියේ 114 වන වගන්තිය මෙයින් ඉවත් කරනු ලැබේ. *(ප්‍රධාන ප්‍රඥප්තියේ 114 වන වගන්තිය ඉවත් කිරීම.)*

ප්‍රධාන ප්‍රඥප්තියේ 115 වන වගන්තිය සංශෝධනය කිරීම.

**5.** ප්‍රධාන ප්‍රඥප්තියේ 115 වන වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ :—

(1) ඒ වගන්තියේ (1) වන උපවගන්තියේ "ඒ උසස් අධ්‍යාපන ආයතනය විසින්" යන වචනවල සිට "පිළිගත හැකිය." යන වචන දක්වා වූ සියලු වචන වෙනුවට "ඒ උසස් අධ්‍යාපන ආයතනය විසින් පිළිගත හැකිය." යන වචන ආදේශ කිරීමෙන් ; සහ

(2) ඒ වගන්තියේ (2) වන උපවගන්තියෙහි "117 වන වගන්තියේ විධිවිධානවලට යටත්ව අදාළ උසස් අධ්‍යාපන ආයතනයේ" යන වචන වෙනුවට "අදාළ උසස් අධ්‍යාපන ආයතනයේ" යන වචන ආදේශ කිරීමෙන්.

ප්‍රධාන ප්‍රඥප්තියේ 116 වන වගන්තිය සංශෝධනය කිරීම.

**6.** ප්‍රධාන ප්‍රඥප්තියේ 116 වන වගන්තිය, පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ :—

(1) ඒ වගන්තියේ දැක්වෙන "ශිෂ්‍ය සම්බන්ධතා සභාවට" යන වචන වෙනුවට "විශ්ව විද්‍යාල ශිෂ්‍ය සමිතියට සහ පීඨ ශිෂ්‍ය සමිතියට" යන වචන ආදේශ කිරීමෙන් ; සහ

(2) ඒ වගන්තියේ පාර්ශ්ව සටහනේ "ශිෂ්‍ය සම්බන්ධතා සභාවලට" යන වචන වෙනුවට, "විශ්ව විද්‍යාල ශිෂ්‍ය සමිතිවලට සහ පීඨ ශිෂ්‍ය සමිතිවලට" යන වචන ආදේශ කිරීමෙන්.

ප්‍රධාන ප්‍රඥප්තියේ 117 වන වගන්තිය ඉවත් කිරීම.

**7.** ප්‍රධාන ප්‍රඥප්තියේ 117 වන වගන්තිය මෙයින් ඉවත් කරනු ලැබේ.

ප්‍රධාන ප්‍රඥප්තියට උපලේඛනය එකතු කිරීම.

**8.** ප්‍රධාන ප්‍රඥප්තිය අගට, මෙහි පහත දැක්වෙන උපලේඛනය මෙයින් එකතු කරනු ලැබේ :—

"උපලේඛනය

(112 වගන්තිය)

**විශ්ව විද්‍යාල ශිෂ්‍ය සමිතිය සහ පීඨ ශිෂ්‍ය සමිතිය**

1. (1) එක් එක් උසස් අධ්‍යාපන ආයතනයේ විශ්ව විද්‍යාල ශිෂ්‍ය සමිතිය, ඒ ආයතනයේ මුළු මහත් ශිෂ්‍ය ප්‍රජාව ම නියෝජනය වන්නක් විය යුතු ය.

(2) එක් එක් උසස් අධ්‍යාපන ආයතනයේ විශ්ව විද්‍යාල ශිෂ්‍ය සමිතිය, එක් එක් පීඨ ශිෂ්‍ය සමිතියේ සියලු සාමාජිකයන්ගෙන් සමන්විත විය යුතු අතර, ඒ සමිතිය විසින් මෙහි පහත සඳහන් නිලධරයන් තෝරා පත්කර ගත යුතු ය :—

(අ) සභාපති

(ආ) උප සභාපති

(ඇ) ලේකම්

(ඈ) සංස්කාරක සහ

(ඉ) කණිෂ්ඨ භාණ්ඩාගාරික.

2. විශ්ව විද්‍යාල ශිෂ්‍ය සමිතියේ කාර්ය හා කර්තව්‍ය මෙසේ විය යුතු ය:—

(අ) විශ්ව විද්‍යාලයේ ශිෂ්‍යයන් අතර සහයෝගී සහජීවන හැඟීම ප්‍රවර්ධනය කිරීම;

(ආ) පාලන අධිකාරියේ උපදෙස් විමසා විශ්ව විද්‍යාල විනෝද කටයුතු පහසුකම්, අධ්‍යාත්මික හා ආගමික කටයුතු, ශිෂ්‍යයන්ට උපදේශන, කෑම සහ ආහාර පාන සැපයීම යනාදියෙහි ශිෂ්‍ය ශුභ සාධන ක්‍රියාකාරකම් සංවිධානය කිරීම හා අධීක්ෂණය කිරීම;

(ඇ) ශිෂ්‍යයන් ජීවත්වන හා වැඩකරන තත්ත්වයට අදාළ හෝ සම්බන්ධ කාරණා පිළිබඳව එවැනි උසස් අධ්‍යාපන ආයතනවල බලධාරීන් සමග පිළිගත් අදහස් හුවමාරු කිරීමේ ක්‍රමයක් සැලසීම;

(ඈ) විශ්ව විද්‍යාලයේ ශිෂ්‍ය ශුභ සාධන කටයුතු භාර ගැනීම සඳහා, පාලන අධිකාරිය විසින් තත්කාර්යය සඳහා සාදනු ලබන රීතිවලට අනුකූලව, පත් කරනු ලබන වෙනත් යම් මණ්ඩලයක නියෝජනය වීම;

(ඉ) විනය ආරක්ෂා කිරීම සඳහා විශ්ව විද්‍යාල බලධාරීන්ට සහායවීම;

(ඊ) විනය පරීක්ෂණවල දී චූදිත ශිෂ්‍යයන් නියෝජනය කිරීම;

(උ) ශිෂ්‍යයන් අතර සංස්කෘතික, සාහිත්‍ය හා සෞන්දර්යාත්මක හැඟීම් හා ක්‍රියාකාරකම් වර්ධනය කිරීම සහ ශිෂ්‍යයින්ගේ සඟරා සහ වාර සංග්‍රහ සංවිධානය කිරීම හා පළ කිරීම;

(ඌ) රටේ පුරවැසියන්ගේ කලා ශිල්ප, ජීවනය, සමාජ ශුභ සිද්ධිය ගැන උනන්දුවක් හා අවබෝධයක් ඇති කිරීම;

(එ) ශිෂ්‍ය ප්‍රජාවගේ සමාජමය හා සදාචාරාත්මක ශුභ සිද්ධියට හිතකර වන ක්‍රියාකාරකම් වර්ධනය කිරීම සහ යහපත් සමාජ ජීවිතයකට හිතකර ක්‍රියාකාරකම් ප්‍රවර්ධනය කිරීම;

(ඒ) ශ්‍රී ලංකාව තුළ සහ විදේශවල වෙනත් විශ්ව විද්‍යාල හා ඊට සමාන සංවිධාන සමග සංස්කෘතික, සාහිත්‍යමය හා සමාජමය අන්තර් ක්‍රියාකාරකම් සංවිධානය කිරීම හා ප්‍රවර්ධනය කිරීම;

(ඔ) ව්‍යාප්ති පාඨමාලා සහ වැඩිහිටි අධ්‍යාපන වැඩ සටහන් සංවිධානයේ දී සහ ක්‍රියාත්මක කිරීමේදී විශ්ව විද්‍යාල කාර්ය මණ්ඩලය හා ශිෂ්‍යයන් සමග ඒකාබද්ධව කටයුතු කිරීම;

(ඕ) උසස් අධ්‍යාපන ආයතනයේ හොඳනම රැකගැනීම සහ ආරක්ෂා කිරීම;

(ක) මහජන උනන්දුව ඇති කාරණා ගැන විවාද පැවැත්වීම;

(ග) ජාතික යහපත සහ ජාතික සමගිය වර්ධනය කිරීම;

(ච) උසස් අධ්‍යාපන ආයතනයේ දේපළ රැකගැනීම හා ආරක්ෂා කිරීම;

(ජ) ශාස්ත්‍රීය කටයුතු පිළිබඳ උනන්දුව වර්ධනය කිරීමට හා වැඩි දියුණු කිරීමට පියවර ගැනීම; සහ

(ට) පාලන අධිකාරිය විසින් කලින් කළ තීරණය කරනු ලබන යම් ක්‍රියාකාරකම් භාර ගැනීම.

3. (අ) විශ්ව විද්‍යාලයීය ශිෂ්‍ය සමිතිය සඳහා ජ්‍යෙෂ්ඨ භාණ්ඩාගාරිකවරයකු සිටිය යුතු අතර ඔහු ඒ සමිතියේ නිලධරයන් විසින් නම් කරනු ලැබූ ජ්‍යෙෂ්ඨ ආචාර්යවරයකු විය යුතු ය;

(ආ) විශ්ව විද්‍යාලයීය ශිෂ්‍ය සමිතියේ නිලධරයකු විසින් සමගාමීව පීඨ ශිෂ්‍ය සමිතියක ධුරයක් දැරිය හැකි ය;

(ඇ) මේ පනතේ සඳහන් නිලධරයන් ශාස්ත්‍රීය අධ්‍යයන වර්ෂය අවසානයේදී ධුරය දැරීම අවසන් කළ යුතු ය;

(ඇ) විශ්ව විද්‍යාලයේ ශිෂ්‍ය සමිතියේ ධුරයක පුරප්පාඩුවක් ඇති වූ අවස්ථාවක, ඒ සමිතිය විසින් ඒ පුරප්පාඩුව පිරවීමට සුදුසු තැනැත්තකු හැකි ඉක්මණින් තෝරා පත් කර ගත යුතුය. එසේ තෝරා පත් කර ගනු ලැබූ තැනැත්තා ඔහුගේ පූර්වගාමියාගේ ධුර කාලයෙන් නොගෙවී ඇති කාලය සඳහා ධුරය දැරිය යුතු ය;

(ඉ) පීඨ ශිෂ්‍ය සමිතියක ධුරයක පුරප්පාඩුවක් ඇතිවූ අවස්ථාවක, ඒ පීඨයේ ශිෂ්‍යයන් විසින් ඒ පුරප්පාඩුව පිරවීමට සුදුසු තැනැත්තකු හැකි ඉක්මණින් තෝරා පත් කරගත යුතුය. එසේ තෝරා පත් කර ගනු ලැබූ තැනැත්තා ඔහුගේ පූර්වගාමියාගේ ධුර කාලයෙන් නොගෙවී ඇති කාලය සඳහා ධුරය දැරිය යුතු ය.

4. (1) විශ්ව විද්‍යාල ශිෂ්‍ය සමිතියක් විසින්, අදාළ උසස් අධ්‍යාපන ආයතනයේ ප්‍රධාන විධායක නිලධරයාගේ අනුමතය ඇතිව, ඒ ප්‍රධාන විධායක නිලධරයා විසින් අනුමත කරන ලද සමාජයීය, සංස්කෘතික සහ ශුභසාධක කටයුතු සඳහා මුදල් රැස් කළ හැකි ය.

(2) උසස් අධ්‍යාපන ආයතනයක පාලන අධිකාරිය විසින් විශ්ව විද්‍යාල ශිෂ්‍ය සමිතියක හෝ පීඨ ශිෂ්‍ය සමිතියක හෝ මුදල් වියදම් කිරීමට අදාළව සහ ඒ ඒ සමිතිවල ගිණුම් තැබීමේ ආකාරයට අදාළව, රීති සෑදිය යුතු ය.

5. උසස් අධ්‍යාපන ආයතනයක පාලන අධිකාරිය විසින්, විශ්ව විද්‍යාල ශිෂ්‍ය සමිතියේ සහ පීඨ ශිෂ්‍ය සමිතියේ රැස්වීම් පැවැත්වීමට අදාළව සහ ඒ රැස්වීම්වල වාර්තා තබා ගැනීමේ ආකාරයට අදාළව රීති සෑදිය යුතු ය.

6. (1) පීඨ ශිෂ්‍ය සමිතියකින්, ඒ පීඨයේ සියලුම ශිෂ්‍යයන් නියෝජනය විය යුතු අතර, එවැනි සමිතියක නිලධරයන් ඒ පීඨයේ ශිෂ්‍යයන් විසින් ඒ අධ්‍යයන වර්ෂය සඳහා රහස් ඡන්දයෙන් තෝරා ගත යුතු ය.

(2) පීඨ ශිෂ්‍ය සමිතියක්—

(අ) සභාපතිවරයකුගෙන් ;

(ආ) උපසභාපතිවරයකුගෙන් ;

(ඇ) ලේකම්වරයකුගෙන් ;

(ඈ) සංස්කාරකවරයකුගෙන් ;

(ඉ) කණිෂ්ඨ භාණ්ඩාගාරිකවරයකුගෙන් ; සහ

(ඊ) පහත දැක්වෙන ආකාරයට එක් එක් උසස් අධ්‍යාපන ආයතනයක් විසින් තීරණය කරනු ලබන එවැනි වෙනත් සාමාජිකයන්ගෙන් :—

(i) දෙසියයක් හෝ ඊට අඩු ලියාපදිංචි ශිෂ්‍ය සංඛ්‍යාවක් ඇති පීඨයක් සඳහා සාමාජිකයන් දෙදෙනකුගෙන් ;

(ii) දෙසිය එකේ සිට හාරසියය දක්වා වූ ලියාපදිංචි ශිෂ්‍ය සංඛ්‍යාවක් ඇති පීඨයක් සඳහා සාමාජිකයන් හතර දෙනකුගෙන් ;

(iii) හාරසිය එකේ සිට හයසියය දක්වා ලියාපදිංචි ශිෂ්‍ය සංඛ්‍යාවක් ඇති පීඨයක් සඳහා සාමාජිකයන් හය දෙනකුගෙන් ; සහ

(iv) හයසියයකට වැඩි ලියාපදිංචි ශිෂ්‍ය සංඛ්‍යාවක් ඇති පීඨයක් සඳහා සාමාජිකයන් අට දෙනකුගෙන්

සමන්විත විය යුතු ය.

(3) එක් එක් පීඨ ශිෂ්‍ය සමිතිය සඳහා ජ්‍යෙෂ්ඨ භාණ්ඩාගාරිකවරයකු සිටිය යුතු අතර ඔහු ඒ සමිතියේ නිලධරයන් විසින් නම් කරනු ලැබූ ජ්‍යෙෂ්ඨ ආචාර්යවරයකු විය යුතු ය.

7. පීඨ ශිෂ්‍ය සමිතියක කාර්යය සහ කර්තව්‍ය පහත දැක්වෙන පරිදි විය යුතු ය.

(අ) පීඨයේ ශිෂ්‍ය ප්‍රජාවගේ සාමූහික ජීවිතය සහ සුභ සාධනය ප්‍රවර්ධනය කිරීම;

(ආ) එහි ශිෂ්‍යයන්ගේ ශාස්ත්‍රීය කටයුතු පිළිබඳ උනන්දුව දිරිගැන්වීමට සහ වැඩිදියුණු කිරීමට පියවර ගැනීම;

(ඇ) පීඨයේ සහ ආයතනයේ හොඳ නම රැකගැනීම සහ ආරක්ෂා කිරීම;

(ඈ) පීඨයේ ශිෂ්‍යයන් අතර සංස්කෘතික සහ ක්‍රීඩා කටයුතු පෝෂණය කිරීම;

(ඉ) මුදල් වියදම් කිරීමට සහ පීඨයේ ශිෂ්‍ය ප්‍රජාවගේ පොදු සුභසාධනයට අදාළ කරුණු පිළිබඳව නිර්දේශ විශ්ව විද්‍යාලයීය ශිෂ්‍ය සමිතිය වෙත ඉදිරිපත් කිරීම; සහ

(ඊ) පීඨයේ ශාස්ත්‍රීය සහ සුභසාධන කටයුතුවලට අදාළව පීඨ ශිෂ්‍ය සමිතියක සියලු තීරණ එහි සාමාජිකයන්ගේ බහුතර ඡන්දයෙන් ගනු ලබන බව සහතික කිරීම.".

පාර්ලිමේන්තුවේ පනත් කෙටුම්පත්වල සහ පනත්වල වාර්ෂික දායක මිල (දේශීය) රු. 150 කි. (විදේශීය) රු. 200 කි. කොළඹ 1. රජයේ ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරි වෙත සෑම වර්ෂයකම දෙසැම්බර් මස 15 වැනි දිනට පෙර දායක මුදල් ගෙවා පසුව එළඹෙන එක් එක් වර්ෂය සඳහා ඒවා ලබාගත හැකිය.